මගේ අංකය : ඩී16/ස්.මා./2016,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016.12.16

සියළුම බන්ධනාගාර අධිකාරිවරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරිවරුන් වෙත,

**<u>වර්ෂ අවසාන ස්ථානමාරු 2016.</u>**

පහත නම් සඳහන් නිලධාරින්ගේ සහ නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම්, ස්ථාන මාරු මණ්ඩලය තීරණය පරිදි 2017.02.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ බව අදාළ නිලධාරින්/නිලධාරිනියන් වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. ස්ථාන මාරුවීම ලබා ඇති සියළුම නිලධාරින්/ නිලධාරිනියන් 2017.02.01 දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීමට හැකිවන පරිදි ඔබ ආයතනයේ සේවයෙන් මුදා හැරීමට කටයුතු කළ යුතුය.

03. 2016 වර්ෂ අවසාන ස්ථාන මාරුවීම සඳහා ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරින් ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේනම්, මේ සමඟ එවන අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් අධිකාරි මඟින්, 2017.01.10 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ඉල්ලීම් ඉදිරිපත් කරන විට තමන්ගේ ස්ථිර පදිංචි ලිපිනය සඳහන් කළ යුතුය.

04. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් පසු එම නිලධාරියා/නිලධාරිනිය අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය වී ඇත්නම් ඔවුන් පිළිබඳව ජාතික රක්ෂන භාර අරමුදල වෙත දැනුම් දීම කළ යුතුය.

05. දැනට සේවය කරනු ලබන සේවා ස්ථාන වල වසර 03 කට වඩා සේවය කර ඇති නිලධාරින් සඳහා පමණක් ගමන් වියදම් රජය විසින් ගෙවනු ලැබේ.

06. ස්ථාන මාරු වලින් පසුව එකම පවුලේ අය එකම සේවා ස්ථානයක සේවයේ යෙදී සිටි නම් ඒ ගැන වාර්තා කරන්න.

07. මෙම ලේඛනයේ නම් සඳහන් කර නොමැති නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කර ඇත.

08. මීට පෙර වර්ෂවලදී ස්ථාන මාරු ලබාදී ප්‍රමාද කර ඇති සියළුම නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් 2017.02.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව ද දන්වමි.

**ස්ථාන මාරු මණ්ඩලය:**

1. ජේ.ඒ.පී.ජයසිංහ මහතා - බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)
2. එස්.කේ.යූ. ශාන්ත ප්‍රනාන්දු මහතා - බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන)
3. සී.එස්. අමරවික්‍රම මහතා - පරිපාලන නිලධාරි I

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

## වර්ෂ අවසානයේ ස්ථාන මාරු අභියාචනා අයදුම්පත

ඔබේ අංකය : ................................

නම: ......................................................

තනතුර : .................................................

ලිපිනය : .................................................

.................................................................

.............................................................මගින්,

...............................................................

**<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම.</u>**

ඔබගේ අංක ..................................................................... හා ................................................................. දිනැති

ලිපිය/ යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛණය මගින් මා .....................................................................ට

ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත.

02 පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත මාරුව අවලංගු කරන ලෙස/ සංශෝධනය කරන ලෙස/ සලකා බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිය රීති I කාණ්ඩයෙහි 209 වන වගන්තිය ප්‍රකාරව ඔබගේ කාරුණිකව ඉල්ලා සිටිමි.

i. .......................................................................................................................................................

ii. .......................................................................................................................................................

iii. .......................................................................................................................................................

.......................................................................................................................................................

03 ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාල පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.

i. ..........................................................................

ii. ..........................................................................

iii. ..........................................................................

iv. ..........................................................................

v. ..........................................................................

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයට ලබා දෙන ලෙසද ඉල්ලමි.

පළමුවන මනාපය : ..........................................................

දෙවන මනාපය : ..........................................................

.............................................

අත්සන

බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය

.......................................................................... විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමට පත්වෙමි/නොවෙමි. ඉල්ලීම ඉටු කරමි./ නොකරමි.

අත්සන : ....................................................

නම : ..........................................................

තනතුර : ......................................................

නිල මුද්‍රාව : ..................................................

දිනය : ..............................